


**සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි**
පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා

# නත්තලේදී ක්‍රිස්තුස් වහන්සේව සෙවීම

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නූතන සාන්තුවරයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් අප කවුද කියා දැනගන්න කැමති සියලුදෙනාට මා "අපි ක්‍රිස්තුස්වහන්සේ සොයමු" යන වචන තුනෙන් නිර්වචනය කරන ලද ආරම්භක ස්ථානයක් ඉදිරිපත් කරන්න කැමති..

අපි උන්වහන්සේගෙන් ඉගෙන ගන්න  උත්සාහ කරමු.  අපි උන්වහන්සේව අනුගමනය කරන්න උත්සාහ කරමු.  අපි වඩවඩාත් උන්වහන්සේ මෙන් වෙන්න   වැර දරමු:

අවුරුදු මුලුල්ලේ සැමදාම අපි උන්වහන්සේ සොයමු. එහෙත් විශේෂයෙන් අවුරුද්දේ මේ කාලයේ _ _, අපගේ ප්‍රේමවන්ත ගැලවුම්කාරයාණන්ගේ උපත සිහිකර ප්‍රීතිවන නත්තලේදී __අපගේ හදවත් උන්වහන්සේ කරා වඩවඩාත් නැඹුරු වෙයි.

නත්තල් උත්සවය පැවැත්වීමේ  අංගයක් වශයෙන් අවුරුදු දෙදහසකට කලින් සිටි අය ගැලවුම්කාරයාණන් වහන්සේගේ පැමිණීම පිළිගන්න සූදානම් වූයේ කෙසේදැයි සලකා බලමු.

## එඬේරු

අපි එඬේරු ගැන වැඩියෙන්, නො දන්නෙමු -" රැයාමෙහි පිට්ටනියෙහි තමන්ගේ බැටළු රැළ ප්‍රවේශම් කරමින් " සිටි බව පමණක් දන්නෙමු. ." [1] එඬේරු තමන්ගේ දෛනික ජීවිකාව උපයමින් ජීවත්වූ බොහෝ අයමෙන් සාමාන්‍ය මිනිස්සු වූහ.

ඔවුහු එක් කලක ක්‍රිස්තුන්වහන්සේව ක්‍රියාශීලිව නොසොයපු අයව නියෝජනය කරන අය වෙන්න පුලුවන්, නමුත් අහස විවෘත ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ දන්වන ලද විට ඔවුන්ගේ හදවත් වෙනස් විය.

මොවුහු ස්වර්ගික දූතයන්ගේ හඬට කන්දුන් විගස දැකබලාගන්න බෙත්ලෙහෙමට ගිය අය  වූහ. [2]

## ශාස්ත්‍රවන්තයෝ

ශාස්ත්‍රවන්තයෝ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන මෙසියස්වහන්සේගේ පැමිණීම අධ්‍යයනය කර සිටි ශාස්ත්‍රඥයෝ  වූහ.  ඔවුන්ගේ ඉගෙනීමෙන් ඔවුහු උන්වහන්සේගේ උපතේ ලකුණු හඳුනාගත්හ.  ඔවුන් එම ලකුණු හඳුනාගත් විට ඔවුන්ගේ ගෙවල් අත්හැර "යුදෙව්වරුන්ට රජව උපන් තැනන්වහන්සේ කොතැන්හිද?" කියා  විමසමින් යෙරුසලමට ගමන් කළහ." [3]

ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ඔවුන්ගේ දැනීම හුදෙක් ශාස්ත්‍රාලයීයව පැවතුනේ නැත.  ඔවුහු උන්වහන්සේගේ උපතේ ලකුණු දුටු විගස ක්‍රියාත්මක වූහ.  ඔවුහු ක්‍රිස්තුස් වහන්සේව සොයන්න පිටත්වූහ.

ශාස්ත්‍රවන්තයින්ට ක්‍රිස්තුස් වහන්සේව ඉගෙනීමෙන් හා ශාස්ත්‍රීය අධ්‍යයනයෙන් සොයන අයව නියෝජනය කළහැකිය.  සත්‍යයට තිබුණු ඔවුන්ගේ ලැදියාව අවසානයේදී ක්‍රිස්තුස්වහන්සේව සොයා උන්වහන්සේව රජවරුන්ගේ රජු  එනම්  මිනිස් සංහතියේ ගැලවුම්කරුවාණන්වහන්සේ ලෙස වඳින්න පොළඹවයි. [4]

## සිමියොන් සහ ආනා

සිමියොන් සහ ආනා ක්‍රිස්තුස්වහන්සේව ආත්මයාණන්වහන්සේගෙන් සොයන අයව නියෝජනය කරන්න පුලුවන්.  මේ පුදුමාකාර අය භක්තියෙන් ආගමික වූ අතර උපවාසයෙන් හා යාච්ඤාවෙන් සහ භක්තිවන්ත හා කීකරු ජීවිතවල් ගතකිරීමෙන් දෙවියන්වහනසේගේ පුත්‍රයා එන දවස උනන්දුවෙන් බලා සිටියහ.

ඉවසීමෙන් බලාසිටියෝය.

අවසානයේදී ඔවුන්ගේ විශ්වාසවන්තකම මරියා සහ ජෝසප් දිනක් මිනිස් සංහතියේ පව් තමන්වෙත පවරාගන්නාවූ බිළිඳාව තමන් වෙත පිලිගැන්වීමේ තිළිණය ගෙන දෙයි. [5]

**ඇදහිලිවන්ත නෙපිවරු සහ ලාමන්වරු**

ගැලවුම්කරුවාණන්වහන්සේගේ උපතේ ලකුණු සඳහා නව ලෝකයේ ඇදහිලිවන්තයින් බලා සිටි ආකාරයේ අනුවේදනීය කථාව මෝර්මන්ගේ පොතේ ඇත.

ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිව සිට සමච්චලයට ලක්කරනු ලැබූ හා පීඩා කරනුලැබූ ආකාරය ඔබට මතක ඇති. ඒ කාලයේ ලෞකික අය ඇදහිලිවන්ත අයට මෝඩ මිථ්‍යාවිශ්වාසවල එල්බගෙන සිටිනවා කියා චෝදනා කළහ. ඇත්ත වශයෙන්ම නොඇදහිලිවන්තයින් තමන්ගේ සමච්චලයේදී කෙතරම් මුබර වූවාද කියනවානම් ඔවුහු දේශයෙහි මහත් උද්ඝෝෂණයක් ඇතිකළහ. 3 නෙපි 1:7. ඔවුහු ගැලවුම්කරුවාණන්වහන්සේ උපදිනු ඇති කියා විශ්වාස කළ අයට ගැරහෙව්වෝය.

ඔවුන්ගේ කෝපය හා උදහස කෙතරම් උග්‍රවූවාද කියතොත් ගැලවුම්කරුවාණන්වහන්සේ කෙරෙහි විශ්වාස කළ අයව සදහටම නිශ්ශබ්ද කරවීම කෙරෙහි තද අධිෂ්ඨානය ඇතිකරගෙන සිටියෝය. මොර්මන්ගේ පොත එම නාටකාකාර යෝජනාව වාර්තා කර ඇත. [6]

ඒ කාලයේ ජීවත්වූ ඇදහිලිවන්තවයෝ අනික් අය සිනාවට ලක්කළත්, අවමන් කළත්, සරදම් කළත් ක්‍රිස්තුස්වහන්සේ කරා සොයා යන අයව නියෝජනය කරති. අනික් අය ඔවුන්ව අසංස්කෘත, නොදියුණු හෝ පහසුවෙන් රැවටෙන අය ලෙස විප්‍රරූපණය කළත් ඔවුහු ක්‍රිස්තුස් වහන්සේව සොයා යති.

එහෙත් අනික් අයගේ අපහාසය සැබෑ ඇදහිලිවන්තයින්ව ක්‍රිස්තුස්වහන්සේ සොයා යෑමෙන් අධෛර්‍යවත් නොකරයි

**අපඅ ක්‍රිස්තුස්වහන්සේව සොයමු**

වසර මුලුල්ලේ, මා හිතනවා විශේෂයෙන් මේ නත්තල් සමයේදී, "මම ක්‍රිස්තුස්වහන්සේව සොයන්නේ කොහොමද?" කියා නැවතත් අපෙන් අහන එක අපට ප්‍රයෝජනවත් වෙයි.

තමාගේ ජීවිතයේ දුෂ්කර කාලපරිච්ඡේදයකදී දාවිත් මහ රජ පහත සඳහන් දේ ලිව්වේය: "දෙවියන්වහන්ස, ඔබ මගේ දෙවියන්වහන්සේය;අලුයම ඔබ සොයන්නෙමි: මගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය, මාගේ මාංසය ඔබ කෙරෙහි ආශා ඇත්තේය" [7]

ඇතැම්විට දෙවියන්වහන්සේව සෙවීමේ මේ ආකල්පය දාවිත් දෙවියන්වහන්සේගේ සිතට එකඟවූ මනුෂ්‍යයෙකු ලෙස විස්තර කර තිබීමට එක් හේතුවක් වෙන්නට ඇති. [8]

මේ නත්තල් කාලය තුල සහ මුලු වසර පුරාවට අපි අපගේ ප්‍රේමවන්ත ගැලවුම්කරුවාණන්වහන්සේව, සමාදානයේ කුමාරයාව, ඊශ්‍රායෙලේග් ශුද්ධ තැනන්වහන්සේව අපගේ හදවත්වලින් හා ආත්මවල්වලින් සොයන්නෝ වෙත්වා. මක්නිසාදයත් මේ ආශාව බොහෝ දුරට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නූතන සාන්තුවරයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පමණක් නොව, වඩාත් නිවැරදිව, ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයින් වශයෙන් අප කව්ද යන්න නිර්වචනය කරයි

**සටහන්**

1. ලූක් 2:8.
2. බලන්න ලූක් 2:15.
3. බලන්න මතෙව් 2:1–2.
4. බලන්න මතෙව් 2:11.
5. බලන්න ලූක් 2:22–38
6. බලන්න 3 නෙපි 1.
7. ගීතාවලිය 63: 1.
8. බලන්න ක්‍රියා 13:22.

---

**මෙම පණිවිඩයේ ඉගැන්වීම**

සභාපති උච්ට්ඩෝර්ෆ් යෝජනා කරන විදිහට අපට වඩා හොඳින් ක්‍රිස්තුස්වහන්සේව සෙවිය හැක්කේ කොහොමද? ඔබ උගන්වන අයට "මම කොහොමද ක්‍රිස්තුස්වහන්සේව සොයන්නේ ?" කියලා තමන්ගෙන් අහන්න දිරිගන්වන්න ඔබට ඉඩ තියෙනවා. ඔවුන් ඔවුන්ගේ පවුල් දෛනික ශුද්ධවූ ලියවිලි අධ්‍යයන වෙලාවේ ඔවුන් එක්එක්කෙනා ක්‍රිස්තුස්වහන්සේව සොයන්නේ කොහොමද යන්න බෙදාගන්න ආරාධනා කිරීම සලකාබලන්න. ඔබට Mormon.org නත්තල්දෘශ්‍යපටය ඔබ උගන්වන අය සමඟ බැලීමටද හැකිය. ඒවාගේම ඔබට පුලුවන් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීම තුලින් ක්‍රිස්තුස්වහන්සේව සෙවීමේ මේ වාර්ෂික අවස්ථාවෙහි සහභාගි වන ලෙස ඔවුන්ට ආරාධනා කරන්න.

## ළමයි

**යේසුස්වහනේස් වෙනුවෙන් බලාසිටීම**

බො හෝ අය යේසුස්වහන්සේගේ උපත බලා සිටියා, එය සඳහා හ පුලපුලා සිටියා දැන් අප උන්වහන්සේ නැවත එන තෙක් බලා ඉන්නවා, ඒ සඳහා රැඳී සිටිනවා. යේසුස්වහන්සේ ගැන ඉගෙනීමෙන් සහ උන්වහන්සේව අනුගමනය කිරීමෙන් අපට සූදානම් වෙන්න පුලුවන්. ඔබ යේසුස්වහන්සෙව අනුගමනය කරන්නේ කොහොමද? තරුවක් ඇඳ එය තුල ඔබගේ අදහස් ලියන්න

© 2017 Intellectual Reserve, Inc. (ඉන්ටලෙක්චුවල් රිසේර්ව් ඉන්ක්.) විසින් සියලුම හිමිකම් ඇවිරිණි ඇ.එ.ජ. මුද්‍රණය කරනලදී. ඉංග්‍රීසි අනුමැතිය : 6/6 පරිවර්තන අනුමැතිය : 6/6 2017 දෙසැම්බර් පළරවනි සභාපතිත්වයේ පණිවිඩයේ පර්වර්තනය 97932 408

# එක්එක්කෙනාගේ  බර ඉසිලීමට කැමති

මෙම ලේඛනය යාච්ඤාපූර්වකව අධ්‍යයනය කර  කුමක් අනික් අය සමඟ බෙදාගන්නදැයි දැනගන්න දේවානුභාවය සොයන්න. සහන සමිතියේ අරමුණ තේරුම්ගැනීම දෙවියන්වහන්සේගේ දහිතෘන්ව සදාකාලික ජීවිතයට කෙසේ  සූදානම් කරනු ඇත්ද?

ඇදහිල්ල පිළිබඳවූ පවුල් සහනය

"අප වටේ  අපගේ අවධානය, දිරිගැන්වීම  සහාය, සැනසීම සහ කරුණාව උවමනාකරන අය සිටිති'' කියා සභාපති තොමස් එස්. මොන්සන් කීවේය.  "අප පොලොව මත සිටින ස්වාමින්වහන්සේගේ  අත් වෙමු. අපට ස්වාමින්වහන්සේගේ දරුවන්ට සේවය කිරීමේ  හා එම දරුවන් එසවීමේ අණ පැවරී ඇත. ස⃝ට උන්වහන්සේ අප එක් එක්කෙනා  මත රැඳී සිටින සේක''. [1]

පළමු සභාපතිත්වයේ පළමු උපදේශක සභාපති හෙන්රි බී. අයිරිං  : "ඔබ සභාව තුලට ආවිට ඔබගේ හදවත තුල විශාල වෙනසක් ඇති විය.  ඔබ ගිවිසුමක් ඇති කරගත්තෙහිය, තවද ඔබ ඔබගේ ස්වභාවයම වෙනස් කරන පොරොන්දුවක් ඔබ ලැබුවෙහිය..

ඔබ (අනික් අයගේ) බර සැහැල්ලු කිරීමට  හා ඔවුන්ව සැනසී සිටීමට දෙවියන්වහන්සේට උදව් කරන .බවට ඔබ පොරොන්දුවූයෙහිය.  ඔබ ශුද්ධාත්මයාණන්ගේ  දීමනාව ලැබූවිට එම බර සැහැල්ලු කිරීමට බලය දෙනුලැබූවෙහිය'' [2].

"ගැලවුම්කරුවාණන්වහන්සේ අනුකම්පාව. බලාපොරොත්තුව සහ දයාවෙ ආදියෙන්  බලන ආකාරයට අන් අය දෙස බැලීමට ශුභාරංචියේ ආලෝකය භාවිතා කිරීමට අපට උවමනාය,'' සහන සමිතියේ ප්‍රධාන සභාපති ජීන් බී. බිංහැම් පැවසුවාය. අප අනික් අය වෙත ප්‍රේමවන්ත සිතුවිලි හා වචන නිකුත් කරනවා වාගේ  අන් අයගේ  හදවත් පිලිබඳ සම්පූර්ණ වැටහීමක් තියෙන  හා අප වෙත දයාව ලැබීම ගැන ස්තුතිපූර්වක වන දිනය පැමිනෙයි.

"අප වැඩියෙන් අපගේ ගැලවුම්කරුවාණන්වහන්සේ  මෙන් වීමට උත්සාහ කරන විට අපගේ බැඳීම හා වරප්‍රසාදය සෑම එක්කෙනා තුලම දියුණුව වැලඳගැනීමයි.'' [3]

අප එක්එක්කෙනාගේ බර උසුලමින් අපගේ ගිවිසුම් පිළිපදිනවිට, අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අන් අය සුවකිරීමට මාර්ගය විවෘත කරන්නෙමු.  ප්‍රේරිතයින් දොළොස් දෙනාගේ ගණපූර්ණයට අයත් වැඩිහිටි ආර්. ජෙෆ්රි ආර්. හොලන්ඩ් මෙසේ  ඉගැන්නුවේය: "කුරුසගැන්වීමේ හා වන්දිගෙවීමේ අවබෝධකරගන්ඩ බැරි මිල සැලකිල්ලට ගෙන මම ඔබට පොරොන්දු වෙනවා උන්වහන්සේ දැන් පිටුපාන්න යන්නේ නැහැ. උන්වහන්සේ "සිතින් දිලුඳු අය මා වෙත එන්න'' යයි කියන විට උන්වහන්සේ අදහස් කරන්නේ උන්වහන්සේ පිට වෙන මාර්ගයත් ඉහල යන මාර්ගයත් දන්නා බවයි. උන්වහන්සේ එම මාර්ගයේ ඇවිද්ද නිසා උන්වහන්සේ එය දන්නාසේක. උන්වහන්සේ   මාර්ගය වන  නිසා උන්වහන්සේ මාර්ගය දන්නා සේක [4].

## *අමතර  ශුද්ධ ලියවිලි*

මතෙව් 25: 40;  ගලාති 6: 2; මොසායා 2:17;

**සටහන්**

1. තොමස් එස්. මොන්සන්, "ස්වාමින්වහන්සේට ආදරයෙන් සේවය කරන්න'' ලයහෝනා පෙබරවාරි,  2014, 4
2. හෙන්රි බී. අයිරිං, "සැනසිලිදායකයාණෝ'' ලයහෝනා, මැයි 2015, 18
3. ජීන් බී. බිංහැම්, "I Will Bring the Light of the Gospel into My Home," ("මම මගේ නිවස තුලට ශුභාරංචියේ ආලෝකය ගෙන එන්නෙමි''  )  ලයහෝනා, නොවැ. 2016, 6, 8.
4. ජෙෆ්‍රි ආර්. හොලන්ඩ්,  ""Broken Things to Mend," ("බිඳුනු දේ හරිගස්සන්න'') ලයහෝනා , මැයි 2006, 71.

**පහත සඳහන් දේ සැලකිල්ලට ගන්න**

අන් අයගේ බර උසුලන්න උදව් කිරීම  සහ අපගේ ගිවිසුම් ඉටුකිරීම උවමනාවල් තියෙන අය සුව කරන්න යේසුස්  ක්‍රිස්තුස්වහන්සේට මාර්ගය විවෘත කරන්නේ කෙසේද?

© 2017 Intellectual Reserve, Inc. (ඉන්ටලෙක්චුවල් රිසේර්ව් ඉන්ක්.) විසින්  සියලුම හිමිකම් ඇවිරිණි  ඇ.එ.ජ. මුද්‍රණය කරනලදී. ඉංග්‍රීසි අනුමැතිය : 6/6 පරිවර්තන අනුමැතිය : 6/6 දෙසැම්බර් 2017 බැහැදැක උගන්වන පණිවිඩයේ පරිවර්තනය භාෂාව. 97932 408